# Year 2021' Dormant Insurance /උදාසීන රක්ෂණය

## කොරියාවේ සේවය කල කාලය තුල හිමි රක්ෂණ මුදල් සම්බන්ධ නිවේදනයයි!

(ත්වෙපිකුම් සහ මවි රටට යාමේදි ගුවන් ටිකට්පත් මිලදී ගැනීමට අදාලව)

ශ්‍රී ලංකාව හා දකුණු කොරියානු ජනරජය අතර ක්‍රියාත්මක වන අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව ඔබ එරට සේවය කරන ලද සේවා කාලයේදි ඔබගේ වැටුපෙන් අඩු කරගත් රක්ෂණ වාරික මත හිමිකම් ලබන ප්‍රතිලාභ (ත්වෙපිකුම්) සහ මවි රටට යාමේදි මිලදිගත් ගුවන් ටිකට්පත් සදහා වැය වු වියදම් පියවා ගැනීමට අදාළ මුදල් ලබා ගැනීම සදහා පහත දක්වා ඇති පරිදි නියමිත ලියකියවිලි සමග මෙහි දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ අයදුම් කල හැක.

- ❖ **විද්‍යුත් තැපැල් ලිපිනය -** ***epscenterlk@yahoo.com***
- ❖ රක්ෂණ මුදල් සදහා අයදුම් කිරීමට ඔබගේ නම මේ සමග අමුණා ඇති ලැයිස්තුවෙහි ඇතුළත්ව ඇත්දැයි ප්‍රථමයෙන් පරීක්ෂා කරන්න
- ❖ මෙම ලැයිස්තුවෙහි නම ඇතුළත් වුවද, ඔබ මේ වනවිටත් මෙම රක්ෂණ මුදල් ලබාගෙන හෝ රක්ෂණ මුදල් ලබාගැනීම සදහා අයදුම්පත් යොමුකර ඇත්නම්, නැවත ගෙවීමක් හෝ අයදුම්පත් යොමුකිරීමක් සිදුකරනු නොලැබේ.

- **දැනට දකුණු කොරියාවේ සේවය නිමකොට පැමිණි සේවක මහත්ම/මහත්මීන් විසින් ඉල්ලුම් කරන්නේ නම්,**

1. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත).
2. ගුවන් ගමන් බලපත්‍රයේ පළමු පිටුවෙහි ස්කෑන් පිටපතක් (ඡායාරූපය සහිතව)
3. ජාතික හැදුනුම්පතෙහි ස්කෑන් පිටපතක් (Scan ID)
4. කොරියාවෙන් පිටවු බවට වු ආගමන විගමන මුද්‍රාව ස්කෑන් පිටපතක් (Departure Seal)
5. ලංකාවේ සක්‍රිය බැංකු ගිණුමක පිටපතක් ස්කෑන් පිටපතක් (මෙහිදි බැංකුවේ නම, ශාඛාවල ගිණුම් අංකය හා ගිණුම් හිමියාගේ නම සඳහන් විය යුතුය. එසේම බැංකුවට අදාල Swift Code සදහන් කල යුතුය. එසේම **ගුවන් ගමන් බලපත්‍රයේ සදහන් නම ඒ ආකාරයෙන්ම බැංකු ගිණුමේ සටහන් විය යුතුය**).

- **දැනට වෙනත් විදේශිය රටක සිටින කොරියාවේ සේවය කර එරටින් පිටවු අයකුගේ නියෝජිතයෙකු ඉල්ලුම් කරන්නේ නම්,**

1. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත)
2. සේවකයා තම අත් අකුරින් ලියන ලද ඔහුගේ/ඇයගේ දුරකථන අංකය සහිත බලය පැවරු ලිපියක් (ඔහු/ඇය සිටින රටෙහි තානාපති කාර්යාලය සහතික කරන ලද),
3. බලය පැවරු නියෝජිතයාගේ ඥාති සබඳතාවය පෙන්නුම් කලහැකි උප්පැන්න සහතිකය/විවාහ සහතිකය
4. ඔහුගේ/ඇයගේ සක්‍රිය බැංකු ගිණුමක පිටපතක්
5. ගුවන් ගමන් බලපත්‍රයේ හෝ ජාතික හැදුනුම්පතේ පිටපතක්

මේ සියල්ල නීතිඥයකු ලවා සහතික කොට විදේශ කටයුතු අමාත්‍යංශයෙන් (Consular Division) සහතික කොට ගත යුතුය. අවසානයේ දි ශ්‍රී ලංකා කොරියානු තානාපති කාර්යාලය මගින් සහතික කර EPS ආයතනය වෙත විද්‍යුත් තැපැල ඔස්සේ යොමු කර යුතුය.

- **දකුණු කොරියාවේ සේවය කොට පැමිණි දැනට ශ්‍රී ලංකාවේ සිටින අයකුගේ නියෝජිතයෙකු ඉල්ලුම් කරන්නේ නම්,**

1. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත).
2. ගුවන් ගමන් බලපත්‍රයේ පළමු පිටුවෙහි ස්කෑන් පිටපතක් (ඡායාරූපය සහිතව)
3. සේවකයා විසින් තමාගේ අත් අකුරින් ඉංග්‍රිසි භාෂාවෙන් ලියන ලද ඔහුගේ/ඇයගේ දුරකථන අංකය සහිත බලය පැවරු ලිපියක ස්කෑන් පිටපතක්
4. ගුවන් ගමන් බලපත්‍රයේ පළමු පිටුවෙහි ස්කෑන් පිටපතක් (ඡායාරූපය සහිතව)
5. නියෝජිතයාගේ හා සේවකයාගේ ජාතික හැදුනුම්පතෙහි ස්කෑන් පිටපත් (Scan ID)
6. කොරියාවෙන් පිටවු බවට වු ආගමන විගමන මුද්‍රාව ස්කෑන් පිටපතක් (Departure Seal)
7. අදාල සේවකයාගේ සක්‍රිය බැංකු ගිණුමක ස්කෑන් පිටපතක්

උක්ත ලියවිලි නීතිඥයකු ලවා සහතික කරවාගත යුතුය.

- **දකුණු කොරියාවේ සේවය කොට මියගිය අයකු වෙනුවෙන් පවුලේ සමාජිකයෙකු ඉල්ලුම් කරන්නේ නම්,**

A. සම්පූර්ණ කරන ලද රක්ෂණ අයදුම්පතෙහි ස්කෑන් පිටපතක් (රක්ෂණ අයදුම්පත සහ එය පිරවිය යුතු ආකාරය දැක්වෙන ආදර්ශ අයදුම්පතමේ සමග අමුණා ඇත).

B. මියගිය අය වෙනුවෙන් ඉදිරිපත් කල යුතු ලේඛන

| | |
|---|---|
| 1. | මරණ සහතිකය |
| 2. | උප්පැන්න සහතිකය |
| 3. | ගුවන් ගමන් බලපත්‍ර ඡායා පිටපතක් (ඡායාරූපය සහිත පිටුව) |
| 4. | කොරියාවෙන් පිටවු බවට වු ආගමන විගමන මුද්‍රාව (Departure Seal) |
| 5. | ජාතික හැදුනුම්පතෙහි ඉදිරිපස සහ පිටුපස ඡායා පිටපත් |

1, 2, 5 අංක යටතේ ඇති ඉදිරිපත් කල යුතු ලේඛන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර, අංක 3 සහ 4 හි දක්වා ඇති ලේඛන සමග අදාල සහතික කිරීම් සදහා ඉදිරිපත් කළ යුතුය. සෑම විටම මුල් ලේඛන ඡායා පිටපත් සමග ඉදිරිපත් කල යුතුය.

C. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන

| | |
|---|---|
| 1. | පවුලේ ඥාතිත්වය සනාථ කරන සහතිකයක් (උප්පැන්න සහතිකය/විවාහ සහතිකය) |
| 2. | සක්‍රිය බැංකු ගිණුමක ඡායා පිටපතක් ගිණුම් හිමියාගේ නම, අදාල බැංකුවේ Swift කේතය සමග |
| 3. | ජාතික හැදුනුම්පතෙහි ඉදිරිපස සහ පිටුපස ඡායා පිටපත් |

අංක 1 යටතේ ඇති ඉදිරිපත් කල යුතු ලේඛන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර, අංක 2සහ 3 හි දක්වා ඇති ලේඛන සමග අදාල සහතික කිරීම් සදහා ඉදිරිපත් කළ යුතුය. සෑම විටම මුල් ලේඛන ඡායා පිටපත් සමග ඉදිරිපත් කල යුතුය.

ඉහත කාණ්ඩ 2වම අදාල (B සහ C) සියලුම ලියකියවිලි නීතිඥයකු ලවා සහතික කර එම ලියකියවිලි විදේශ කටයුතු අමාත්‍යංශයෙන් (Consular Division) සහතික කොට ගත යුතුය. අවසානයේ දි ශ්‍රී ලංකා කොරියානු තානාපති කාර්යාලය මගින් සහතික කර EPS ආයතනය වෙත විද්‍යුත් තැපැල ඔස්සේ යොමු කර යුතුය.

❖ **බැංකු ගිණුමෙහි නම සටහන් විය යුතු ආකාරය**

උදා:
ගුවන් ගමන් බලපත්‍රයේ නම:
වාසගම - රත්නායක
වෙනත් නම් - මුදියන්සේලාගේ සුමුදු නිමන්ත

පහත සදහන් පරිදි බැංකු පොතෙහි නම සටහන් විය යුතුය
1.රත්නායක මුදියන්සේලාගේ සුමුදු නිමන්ත හෝ
2. R.M. සුමුදු නිමන්ත හෝ
3. R.M.S.නිමන්ත

❖ **ඉහත සදහන් කර ඇති පරිදි ඔබ මේ වනවිටත් මෙම රක්ෂණ මුදල් ලබාගෙන හෝ රක්ෂණ මුදල් ලබාගැනීම සදහා අයදුම්පත් යොමුකර ඇත්නම්, නැවත ගෙවීමක් හෝ අයදුම්පත් යොමුකිරීමක් සිදුකරනු නොලැබෙන බැවින් කිසිඳු ආකාරයකින් අයදුම් කිරීමක් හෝ ඒ පිළිබඳව විමසීමක් සිදුකිරීමෙන් වළකින්න.**

**ශ්‍රී ලංකා EPS මධ්‍යස්ථානය**
(2021.02.05)